# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1907/52 - 2015 මාර්තු මස 27 වැනි සිකුරාදා - 2015.03.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය*: අනු/13/5/1/9/1.
*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය*: LD05/2008/HW/207.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නුවරගම් පළාත සුළු කොට්ඨාසයේ, ඉහල තලාව, මොරගොඩ යන ගම්වල පිහිටි මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද මැනුම්පතිගේ පිඹුරු විස්තර අංක අනු/මැ/4/RDA/TLW සහ අවසාන ගම් පිඹුරු අංක 302 අතිරේක 22, පත්‍ර 28 - 2011.10.19 හා අවසාන ගම් පිඹුරු අංක 302 අතිරේක 13, පත්‍ර 19 කැබලිවල ඇතුලත ඇති ඉඩම් පෙන්වන මැනුම්පතිගේ පිඹුරු විස්තර හා 2014.12.08 දිනැතිව හෙක්ටයාර් 0.0311 පමණ වූ පහත සඳහන් නම් වලින් යුත් ඉඩම් කොටස්:

01. කැබලි අංකය — අ.ග.පි. 302/900

ඉඩමේ නම: මාර්ග රක්ෂිතය තුළ පිහිටා ඇත; හිමිකම් කියන්නා: රජය.

02. කැබලි අංකය — අ.ග.පි. 302/936

ඉඩමේ නම: මාර්ග සංවර්ධන අධිකාරියට අවශ්‍යව ඇත; හිමිකම් කියන්නා: රජය.

03. කැබලි අංකය — අ.ග.පි. 302/15G

ඉඩමේ නම: මාර්ග සංවර්ධන අධිකාරියට අවශ්‍යව ඇත; හිමිකම් කියන්නා: රජය.

ඉහත සඳහන් ඉඩම් වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2015 අප්‍රේල් 27 වැනි දින පෙ. ව. 10.00 ට තලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2015 අප්‍රේල් මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල් ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය, පරීක්ෂණයේ දී ඉදිරිපත් කල යුතු ය.

සන්ධ්‍යා එන්. ජී. අබේසේකර,
ප්‍රාදේශීය ලේකම්.
තලාව.

තලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04-425


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*



1A - G 21312 - 27 - (2015/03)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.